

වර්ෂ 2015 ක්වූ ජනවාරි මස 5 වැනිදා සඳුදා
දිනමිණ
The Dinamina
ජාත්‍යන්තරය ජයගත්
මහින්ද

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් පසුගිය නම වසර තුළ ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා පෙර පැවැති රජයන් විසින් අනුගමනය කරන ලද බෙහෙවින් බටහිරට නැඹුරු ප්‍රතිපත්තීන්ගෙන් බැහැරව නව ඉසව්වක් කරා ගෙන ගොස් ඇත. නොබැඳි ජාතියක් වශයෙන් කිසිදු රජයකට හෝ කඳවුරකට ගැති නොවී ශ්‍රී ලංකාව අද සියලු රටවල් සමඟ එලදායි අයුරින් සබඳතා පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාව දෙකඩ කිරීමට මාන බලාගෙන සිටින කිසිදු විදේශීය බලවේගයකට එතුමා හිස නොනැමීය. චෝගම් හෙවත් පොදු රාජ්‍ය මණ්ඩලීය රැස්වීම ශ්‍රී ලංකාවේ පැවැත්වීම පසුගිය අවුරුදු කීපය තුළ ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා උද්දීපනයට ලක්වූ අවස්ථාවක් විය. පොදු රාජ්‍ය මණ්ඩලයේ සක්‍රිය සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව වර්තමානයේ එහි සභාපති ධුරය හොබවමින් සිටී. නොබෝදා ජපාන අගමැතිවරයා සහ චීන ජනාධිපතිවරයාද දිවයිනට පැමිණියහ. අනෙකුත් බොහෝ රාජ්‍ය නායකයෝද දිවයිනට පැමිණියහ. ජනාධිපති රාජපක්ෂ මැතිතුමා ඉන්දියාව, චීනය, ජපානය, ඕස්ට්‍රේලියාව සහ ඉරාණය වැනි බොහෝ රටවල නිල චාරිකාවලට සහභාගී වී ඇත. එමගින් එම රටවල් සමඟ සබඳතා වැඩිදියුණු කරගැනීමට හැකි වී තිබේ. විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ද්විපාක්ෂික ගිවිසුම් වලටද එළඹී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ විදේශීය ආයෝජකයින් මෙරට තුළ ආයෝජනය කර තිබේ.

ජනාධිපති රාජපක්ෂ මැතිතුමා එක්සත් ජාතීන්ගේ සහ සාර්ක් සමුළු ඇතුළු විවිධ ජාත්‍යන්තර වේදිකාවලදී ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිව සටන්වැදීමේ අවශ්‍යතාවය ඇතුළු විවිධ කරුණු අවධාරණයට ලක් කරමින් ඉමහත් සේවයක් සලසා ඇත. ලෝකයේ අතිශය බිහිසුණු ත්‍රස්තවාදය පරාජයට පත් කළ ශ්‍රී ලංකාවේ අත්දැකීම් ප්‍රයෝජනයට ගන්නා ලෙස එතුමා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඉල්ලා ඇත.

ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ ශ්‍රී ලංකාව මෙතෙක් නොවූ විරූ අයුරින් මූල්‍ය ආධාර මිත්‍ර රටවලින් ලබාගැනීමට සමත් වී සිටී. එම අරමුදල් අධිවේගී මාර්ග සහ උතුරු දුම්රිය මාර්ගය ඇතුළු දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිවලට මහත් පිටිවහලක් විණි. ජනාධිපති රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය තුළ ශ්‍රී ලංකාව ආසියාවේ සහ ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රධාන පෙළේ සාමාජිකයෙක් වී සිටී.

ඇතැම් බලගතු රටවල් ලෝකයේ අනෙක් රටවල් අතර සමානාත්මතාවය දේශනා කරමින් සිදු කරනු ලබන අයුතු අසාධාරණකම් වලට එරෙහිව එතුමාගේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකාව දිගින් දිගටම හඬ නඟනු ඇත.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වතිකානුවේදී 1 වෙනි ප්‍රැන්සිස් පාප්තුමා මුණ ගැසී 2015 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වන ලෙස උන්වහන්සේට නිලවශයෙන් ආරාධනය කරන ලදී.

ජනාධිපති කා...
පුස්තකාල...

BKT 02447
26/08/2023



ඇමෙරිකානු ජනාධිපති බරක් ඔබාමා සහ ජනාධිපති ආර්යා මිචෙල් ඔබාමා යුවළ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිණිය සමඟ 2014 සැප්තැම්බර් 23 වෙනි දින නිව්යෝර්ක් නගරයේ පිහිටි වොල්ඩෝර්ෆ් ඇස්ටෝරියා හෝටලයේ පැවැති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සම්භාෂණයේදී.




ඇෆ්ගනිස්ථානු ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති හමීඩ් කර්සායි, බංග්ලාදේශ ජනතා ජනරජයේ ප්‍රධාන උපදේශක ආචාර්ය ෆකුරුඩීන් අහමඩ්, භූතාන රාජකීය ආණ්ඩුවේ අගමැති ලියොන්චිචෙන් ජිග්මි වයි තින්ලි, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ, ඉන්දීය ජනරජයේ අගමැති ආචාර්ය මන් මෝහන් සිං, මාලදිවයින ජනරජයේ ජනාධිපති අබ්දුල් ගයුම්, නේපාල අගමැති ගිරිජා ප්‍රසාද් කොයිරාල සහ පකිස්ථාන ඉස්ලාමීය ජනරජයේ අග්‍රාමාත්‍ය සෙයිඩ් මහ්ක්ඩූම් යූසේ රාසා ගිලානි යන රාජ්‍ය නායකයින් 2008 කොළඹ පවත්වන ලද සාක් සමුළුවේදී.

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ෂැංහයි එක්ස්පෝ මධ්‍යස්ථානයේ පැවති ආසියානු අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ 4 වෙනි සාකච්ඡා සමුළුවට පැමිණි ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා චීන ජනාධිපති සී. ජින් පිං මහතා විසින් පිළිගත් අයුරු.

- ඡායාරූපය සුදත් සිල්වා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දකුණු කොරියානු අගමැති ජං හොං - වොන් මහතා සමග ජනාධිපති මන්දිරයේදී පැවැති ද්විපාර්ශ්වික සාකච්ඡා වටයේදී.

ජනාධිපති කාර්යාලය

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉන්දිය අගමැති නරේන්ද්‍ර මෝඩි මහතා සමග ද්වි පාර්ශ්වික සාකච්ඡා වලට සහභාගී වෙමින්.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බොලිවියාවේ සාන්තා ක්‍රූස් හි G77 චීන සමුළුව පැවති අතරවාරයේ රාජ්‍ය නායකයින් රැසක් මුණ ගැසුණි. ජනාධිපතිතුමා කියුබානු ජනාධිපති රාවුල් කැස්ට්‍රෝ මහතා මුණ ගැසුණ මොහොත.
- ඡායාරූපය සුදත් සිල්වා

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



දෙවන එලිසැබත් මහ රැජිනගේ 60 වන විවාහ සංවත්සරයට සහභාගීවීම සඳහා ලන්ඩනයට පැමිණි ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එතුමිය විසින් ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලයේදී 2012 ජූනි 6 දින පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයේදී පිළිගත් අයුරු. ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිණිය සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කමලේශ් ෂර්මාද මෙහි වෙති.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සිය ඇරයුම පරිදි දෙදින නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණි කටාර් රාජකීය පවුලේ ශික් හමාද් බින් කලීෆා අල්තානි මහතා සමග.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



# ජාත්‍යන්තරය ජයගත් මහින්ද




ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා G 15 සමුළුවට සහභාගීවීම සඳහා 2010 මැයි වලදී ටෙහෙරාන් අගනුවරට පැමිණි අවස්ථාවේදී.





ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 2012 නොවැම්බර් 20 වෙනි දින ඇස්ටානා නුවරදී කසකස්ථාන ජනාධිපති නූර් සුල්තාන් නසර්බයෙව් මහතා මුණ ගැසුණු අවස්ථාව.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් සිව් දින නිල සංචාරයක් සඳහා ඉහළ පෙළේ දූත පිරිසක් සමඟ මෙරටට පැමිණි පකිස්ථානු ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති අසිෆ් අලි සර්දාරි මහතා පිළිගත් අයුරු.

බ්‍රිතාන්‍යයේ චාර්ල්ස් කුමරු, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කමලේෂ් ෂර්මා, ජනාධි
පොකුණ මහින්ද රාජපක්ෂ රංග පීඨයේ පවත්වන ලද 2013



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



# ...ර්යගත් මහින්ද

...ති මහින්ද රාජපක්ෂ සහ අනෙකුත් රාජ්‍ය නායකයින් හා ඔවුන්ගේ නියෝජිතයින් නෙළුම් ...දු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ගේ ආරම්භක රැස්වීමේදී.



# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ඇෆ්ගනිස්ථාන් ජනාධිපති හමීඩ් කර්සායි මහතා 2014 මාර්තු 6 දින කොළඹදී පවත්වන ලද නිල පිළිගැනීමේ උත්සවයේදී.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා නිව්යෝර්ක් නගරයේ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ 2014 එක්සත් ජාතින්ගේ දේශගුණික සමුළුව පැවති අතරවාරයේ පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කමලේෂ් ෂර්මා මහතා මුණ ගැසුණ මොහොත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද





ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 2014 සැප්තැම්බර් 28 දින නිව්යෝර්ක් නගරයේ පිහිටි එක්සත් ජාතින්ගේ මූලස්ථානයේදී මහලේකම් බැංකිමූන් මහතා හමු වූ අවස්ථාව.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා උගන්ඩා ජනාධිපති යොවේරි මුසිවේනි සමඟ.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සීෂෙල්ස් ජනාධිපති ජේම්ස් මිචෙල් මහතා විසින් උණුසුම් අයුරින් පිළිගත් අයුරු.

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අප්‍රිකානු සංගමයේ 50 වන සංවත්සරයට සමගාමීව පැවැත්වූ 2013 ග්ලෝබල් ස්මාර්ට් පාට්නර්ෂිප් සංවාදයට සහභාගී වූ අනෙකුත් රාජ්‍ය නායකයින් සහ ඔවුන්ගේ නියෝජිතයින් සමඟ නිල ඡායාරූපයකට පෙනී සිටි අයුරු. - ඡායාරූපය සුදත් සිල්වා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත බොලිවියාවේ ලාපාස්හි ව්‍යවස්ථාදායක සභාවේදී බොලියානු උප ජනාධිපති සහ ව්‍යවස්ථාදායක සභාවේ සභාපති අල්වාරෝ ගාර්ෂියා ලිනේරා විසින් එරට උත්තම සම්මානය පිළිගැන්වූ අයුරු.
ඡායාරූපය - සුදත් සිල්වා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බෙලරුස් රජයේ අගමැති මහාචාර්ය මිහායිල් මියැස්නිකෝවිච් මහතා විසින් දෙරට අතර ද්විපාර්ශ්වික සාකච්ඡා ආරම්භවීමට පෙර පිළිගත් අයුරු. ඡායාරූපය - සුදත් සිල්වා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිනිය ජපානයේ අකිහිතෝ අධිරාජයා සහ මිචිකෝ අධිරාජනිය සමඟ ජපන් රජමාලිගයේදී. එහිදී ජනාධිපතිතුමාට ගෞරව දැක්වීමක් වශයෙන් දිවා භෝජනයක්ද පවත්වන ලදී. ඡායාරූපය - සුදත් සිල්වා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා නිව්යෝර්ක් නගරයේදී නවසීලන්ත අගමැති ජෝන් කී මහතා හමුවූ අවස්ථාව. කිරි නිෂ්පාදනය, තාක්ෂණ හුවමාරුව සහ චෝගම් 2013 ඇතුළු දෙරට අතර සහයෝගිතාවයෙන් ක්‍රියා කළ හැකි විෂයයන් රැසක් රාජ්‍ය නායකයින් දෙපළ අතර සුහද සාකච්ඡාවන්ට බඳුන් විය.
ඡායාරූපය - සුදත් සිල්වා

# ජාත්‍යන්තරය ජයගත් මහින්ද



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඩුබායි රාජ්‍ය පාලක හා එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ උප ජනාධිපති හා අග්‍රාමාත්‍ය ෂික් මොහමඩ් බින් රෂීඩ් අල් මක්ටූම් මහතා සමඟ සාකච්ඡා පවත්වන අයුරු. ඡායාරූපය - සුදත් සිල්වා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 2013 අගෝස්තු 26 දින බෙලරස් ජනරජයේ ජනාධිපති ඇලෙක්සැන්ඩර් ලූකෂෙන්කෝ මහතා එරට මින්ස්ක්හිදී මුණ ගැසුණු අවස්ථාව.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත බහරේන්හි හමාද් බින් ඉසා අල් කලීෆා රජතුමා විසින් එරට ප්‍රකට කලීෆා පදක්කම පිරිනැමූ අයුරු.



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා චීනයේ ෂැංහයි නුවර ආසියානු අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ 4 වෙනි සාකච්ඡා සමුළුව පැවති අතරතුරේ ඉරාන ජනාධිපති හසන් රොහානි මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. ඡායාරූපය - සුදත් සිල්වා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023



ක්ලින්ටන් ගෝලීය වැඩසටහනේ වාර්ෂික සමුළුව 2014 සැප්තැම්බර් 21 - 24 දින ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර දී පැවැත්විණි. හිලරි ක්ලින්ටන් මහත්මිය, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු අනෙකුත් රාජ්‍ය නායකයින් සමග.

SCANNED



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ මාලදිවයිනේ ජනාධිපති අබ්දුල්ලා යමීන් අබ්දුල් ගයූම් මහතා සාර්ක් සමුළුවේදී.